සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

33479


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂය / பாடம் / Subject | විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 03 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டெண் / Index No. ........................

**A** කොටසේ ප්‍රශ්න සතරට දී ඇති ඉඩ ප්‍රමාණය තුළ පිළිතුරු සපයන්න.
**B** කොටසේ ප්‍රශ්න පහෙන් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස - ව්‍යුහගත රචනා

01. (A) ක්ෂේත්‍ර චාරිකාවකදී සිසුන් පිරිසකට හමු වූ ජීවී විශේෂ කිහිපයක් පිළිබඳව ඔවුන් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. එහි සඳහන් කර තිබූ ජීවීන් කිහිපදෙනෙකුගේ රූප සටහන් පහත දක්වා ඇත.




(i) ඉහත ජීවීන් අයත්වන අධිරාජධානිය කුමක්ද? ........................................ (ලකුණු 1)

(ii) ඉහත ජීවීන් අතුරින් ෆන්ගයි රාජධානියට අයත්වන ජීවියා දැක්වෙන අක්ෂරය ලියා දක්වන්න.
........................................ (ලකුණු 1)

(iii) බීජ දරණ අපුෂ්ප ශාකයට හිමි අක්ෂරය කුමක් ද? ........................................ (ලකුණු 1)

(iv) සපුෂ්ප ශාකවල දැකිය හැකි ප්‍රධාන ආකාර දෙක නම් කරන්න. ........................................ (ලකුණු 2)

(v) සිලෝමය නැමති දේහ කුහරය මුලින්ම විකසනය වූ සත්ත්ව වංශයට අයත් ජීවියා දැක්වෙන අක්ෂරය ලියා දක්වන්න. ........................................ (ලකුණු 1)

(vi) ඉහත ජීවීන් අතුරින් ත්‍රිපස්තර, මෘදු දේහ දරන බැවින් මෘදුවංශීන් ලෙස ද හැඳින්වෙන ජීවියා හඳුනාගෙන එම ජීවියාගේ නම සහ අයත්වන වංශය ලියා දක්වන්න. ........................................ (ලකුණු 2)

(vii) වැඩිම ජීවී විශේෂ සංඛ්‍යාවක් ඇතුළත් වන සත්ත්ව කාණ්ඩයට අයත් ජීවියාට හිමි අක්ෂරය කුමක්ද?
........................................ (ලකුණු 2)


EXAMRESULTS.LK

(B) (i) පහත දැක්වෙන ඉන්ද්‍රිකා වලින් ඉටු කරන කාර්යය බැගින් සඳහන් කරන්න.

(a) රයිබසෝම ........................................ (ලකුණු 1)

(b) න්‍යෂ්ටිය ........................................ (ලකුණු 1)

(c) ගොල්ගි දේහ ........................................ (ලකුණු 1)

(ii) ශ්වසනයට සම්බන්ධ වූ සෛලයේ තිබෙන ඉන්ද්‍රිකාව කුමක්ද? ........................................ (ලකුණු 1)

(iii) තුවාල සුවවීම සහ නව සෛල සෑදීමේදී වැදගත්වන සෛල විභාජන ක්‍රමය කුමක්ද?

........................................ (ලකුණු 1)

(මුළු ලකුණු 15)

02. සජීව පදාර්ථය නිර්මාණය වී ඇති රසායනික සංයෝග කාබනික සංයෝග හා අකාබනික සංයෝග ලෙස කාණ්ඩ දෙකකට බෙදිය හැකිය.

(A) (i) ප්‍රවේණික තොරතුරු ගබඩා වී ඇති ජෛව අණු වර්ගය කුමක්ද?

........................................ (ලකුණු 1)

(ii) විද්‍යාගාර පරීක්ෂණයකදී සිසුන් පිරිසක් විසින් එක්තරා ආහාර ද්‍රව්‍යයක් කෝවක දමා රත් කරන ලදී. එහිදී කෝවට ඉහළින් වීදුරු තහඩුවක් අල්ලන ලදී.

(a) වීදුරු තහඩුව මත තැන්පත් වන ද්‍රව බින්දු ජලය ද යන්න හඳුනාගැනීම සඳහා භාවිත කළ හැකි රසායනික ද්‍රව්‍ය 2ක් නම් කරන්න. ........................................

........................................ (ලකුණු 2)

(b) ඉහත (a) හි ඔබ සඳහන් කළ පරීක්ෂණයේදී ලබා ගතහැකි එක නිරීක්ෂණයක් ලියන්න.

........................................ (ලකුණු 1)

(iii) උස ශාක වල කඳ තුළින් ජලය ඉහළට පරිවහනය වීමට වැදගත් වන ජලය සතු සුවශේෂී ගුණය කුමක්ද? ........................................ (ලකුණු 1)

(iv) මිනිසුන්ට කෙණ්ඩා පෙරළීම, ඔක්කාරය, වමනය වැනි ඌණතා ලක්ෂණ ඇති වන්නේ කුමන මූලද්‍රව්‍ය ඌනවීමෙන්ද? ........................................ (ලකුණු 1)

(v) ශාක පත්‍රවල අග්‍රස්ථය මිය යාමට හේතුවන මූලද්‍රව්‍ය කුමක්ද? ........................................ (ලකුණු 1)

(vi) මිනිසාගේ බුද්ධි වර්ධනයට බලපාන මූලද්‍රව්‍ය නම් කරන්න.

........................................ (ලකුණු 1)

(B) මව් ශාකයට සම්බන්ධව තිබියදීම අතු කැබලි මුල් අද්දා ගැනීම අතු බැඳීම ලෙස හඳුන්වයි.

(i) ඉහත අතු බැඳීම සිදුකළ හැකි ක්‍රම 2ක් නම් කරන්න.

1. ........................................ 2. ........................................ (ලකුණු 2)

(ii) අතු බැඳීමේ ප්‍රයෝජනයක් සඳහන් කරන්න.

........................................ (ලකුණු 1)

(iii) (a) බද්ධ කිරීමේදී පසට සම්බන්ධ වන ශාක කොටස හඳුන්වන නම කුමක්ද?

........................................ (ලකුණු 1)

(b) මෙම ශාක කොටස සතුවිය යුතු ගුණාංගයක් ලියන්න.

........................................ (ලකුණු 1)

(iv) බද්ධ කිරීම සිදුකල හැක්කේ කුමන ආකාරයේ ශාක වලටද? ........................................ (ලකුණු 1)

(v) පරපරාගනය ශාක වලට වැදගත් වන්නේ කෙසේ ද?

........................................ (ලකුණු 1)

(මුළු ලකුණු 15)

03. (A) ආවර්තිතා වගුවේ අනුයාත මූලද්‍රව්‍ය 9ක් සහ ඒවායේ පරමාණුක ක්‍රමාංක පහත වගුවේ දැක්වේ.

| මූලද්‍රව්‍ය | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| පරමාණු ක්‍රමාංකය | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 |

මෙම සංකේත පමණක් භාවිතාකර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) අයනීකරණ ශක්තිය අඩුම මූලද්‍රව්‍යයේ නම ලියන්න. .................................................. (ලකුණු 1)

(ii) වැඩිම ආම්ලිකතාවයෙන් යුතු ඔක්සයිඩය සාදන මූලද්‍රව්‍ය කුමක්ද?


.................................................................................................... (ලකුණු 1)

(iii) 'B' මූල ද්‍රව්‍ය වාතයේ දහනය කිරීමේදී දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක්ද?

.................................................................................................... (ලකුණු 1)

(iv) විද්‍යුත් සෘණතාවය වැඩිම මූලද්‍රව්‍ය කුමක්ද? .................................................. (ලකුණු 1)

(B) විද්‍යාගාරයේදී එක්තරා වායුවක් පිලියෙල කිරීම සඳහා සකස්කල ඇටවුමක් පහත දැක්වේ.




(i) ඉහත ඇටවුමේ A, B, C සහ D කොටස් නම් කරන්න. ..................................................

.................................................................................................... (ලකුණු 2)

(ii) ඇටවුමේ දැකිය හැකි දෝෂයක් සඳහන් කරන්න. .................................................. (ලකුණු 1)

(iii) A තුලට එකතුකල යුතු රසායනික සංයෝගය කුමක්ද? ..................................................(ලකුණු 1)

(iv) ඉහත (iii) හි සඳහන් කරන ලද රසායනික සංයෝගය සහ Zn අතර සිදුවන රසායනික ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න. .................................................. (ලකුණු 2)

(C) රසායනික බන්ධන සෑදීමේදී දායක වන්නේ සංයුජතා කවචයේ ඇති ඉලෙක්ට්‍රෝන වේ.

(i) N සහ H මූලද්‍රව්‍ය එකතු වී සෑදෙන සංයෝගයේ ලුවිස් තිත් කතිර සටහන අඳින්න.

(ලකුණු 2)

(ii) ඉහත ව්‍යුහයේ තිත්වලින් නිරූපනය කරන ලද ඉලෙක්ට්‍රෝන යුගල හැඳින්වෙන නම කුමක්ද?

.................................................................................................... ලකුණු 1)

(iii) පහත සඳහන් රසායනික සංයෝගවල අන්තර්ගත බන්ධන වර්ගය කුමක්ද?

(a) $NH_4Cl$ .................................................. (ලකුණු 1)

(b) $C_6H_{12}O_6$ .................................................. (ලකුණු 1)



(මුළු ලකුණු 15)

04. (A) සරල රේඛීය මාර්ගයක ගමන් කරන දුම්රියක් නිශ්චලතාවයෙන් ගමන් අරඹා විනාඩි 5ක් අවසානයෙහි $10\ m\ s^{-1}$ ප්‍රවේගයක් ලබා ගෙන එම ප්‍රවේගයෙන්ම තවත් විනාඩි 15ක් ගමන් කර අවසාන විනාඩි 5 තුලදී තිරිංග යොදා ඊළඟ නැවතුම් පොලේදී නතර කරන ලදී. (ප්‍රවේගය වැඩිවීම සහ අඩුවීම ඒකාකාරීව සිදුවූ බව සලකන්න)

(i) ඉහත තොරතුරු ප්‍රවේග කාල ප්‍රස්ථාරයක ඇඳ දක්වන්න

(ලකුණු 3)

(ii) ප්‍රස්තාරය මගින් පළමු විනාඩි 5 තුළ ත්වරණය $m\ s^{-2}$ වලින් ගණනය කරන්න.

.................................................................................................................... (ලකුණු 2)

(iii) අසංතුලිත බලයක් යෙදී නොමැත්තේ කුමන කාල පරතරය තුලදී ද?

.................................................................................................................... (ලකුණු 2)

(iv) දුම්රිය ගමන් කල සම්පූර්ණ දුර ගණනය කරන්න.

.................................................................................................................... (ලකුණු 2)

(B) (i) දුම්රිය ගමන් ආරම්භයේදී දුම්රිය තුල සිටගෙන සිටි මගියෙකු එක් වරම ඉදිරියට විසි විය. මෙම සංසිද්ධියට අදාල වන්නේ නිවුටන්ගේ කුමන නියමය ද?

.................................................................................................................... (ලකුණු 1)

(ii) දුම්රිය ඒකාකාර ප්‍රවේගයෙන් ගමන් කරන විටදී එහි සිටින ස්කන්ධය 60 kg වන මගියකුගේ ගම්‍යතාවය ගණනය කරන්න.

....................................................................................................................

.................................................................................................................... (ලකුණු 2)

(C) (i) දුම්රිය පාපුවරුව රළුව තැබීමට හේතුව සඳහන් කරන්න.

.................................................................................................................... (ලකුණු 1)

(ii) ඉහත i හි ඔබ සඳහන් කරන ලද සංසිද්ධියේ අවාසිදායක අවස්ථාවක් සඳහන් කරන්න.

.................................................................................................................... (ලකුණු 2)

(මුළු ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

33432

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂය / பாடம் / Subject | විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 යි |

නම / பெயர் / Name ..............................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

උපදෙස්
- I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- සපයන ලද පිළිතුරු පත්‍රය තුළ නිවැරදි පිළිතුර (×) යොදා සලකුණු කරන්න.

01. පහත සඳහන් භෞතික රාශි අතුරෙන් දෛශික රාශියක් වනුයේ කුමක් ද?
1. බර
2. දුර
3. වේගය
4. කාලය

02. පහත දී ඇති ඒවායින් මොනොසැකරයිඩ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) මෝල්ටෝස්, සෙලියුලෝස්, ග්ලූකෝස්
(2) ෆෘක්ටෝස්, ග්ලූකෝස්, මෝල්ටෝස්
(3) ග්ලූකෝස්, ගැලැක්ටෝස්, ෆෘක්ටෝස්
(4) සෙලියුලෝස්, ග්ලූකෝස්, ගැලැක්ටෝස්

03. ප්‍රරෝහණය වන බීජ වල අඩංගු වන්නේ පහත කවරක් ද?
(1) මෝල්ටෝස්
(2) සුක්‍රෝස්
(3) ග්ලූකෝස්
(4) ලැක්ටෝස්

04. රූපයේ පෙන්වා ඇති ඒක සෛලික ජීවියා කවුරුන් ද?



(1) එවුග්ලිනා
(2) පැරමීසියම්
(3) ඇමීබා
(4) ක්ලැමිඩොමොනාස්

05. ශාකයක වර්ධනය නිරීක්ෂණය කිරීම සඳහා භාවිතා කළ හැකි උපකරණය කුමක් ද?
(1) වෘද්ධි මානය
(2) උෂ්ණත්ව මානය
(3) ද්‍රව මානය
(4) පීඩන මානය

06. ලයිකනයක් සෑදීමට දායක වී ඇති ජීවී කාණ්ඩ ඇතුලත් පිළිතුර තෝරන්න.
1. දිලීරයක් සහ බැක්ටීරියාවක්
2. දිලීරයක් සහ ඇල්ගාවක්
3. ඇල්ගාවක් සහ බැක්ටීරියාවක්
4. ඇල්ගාවක් සහ ප්‍රොටොසෝවාවෙක්

07. පහත සඳහන් සංයෝග වලින් අයනික බන්ධන සහිත සංයෝගය කුමක් ද?
(1) $C_6H_{12}O_6$
(2) $C_2H_5OH$
(3) $NH_4Cl$
(4) $HCl$

08. සුක්‍රෝස් අනුවක් සෑදෙන්නේ පහත කුමන අවස්ථාවේදී ද?
1. ග්ලූකෝස් + ග්ලූකෝස්
2. ෆෘක්ටෝස් + ග්ලූකෝස්
3. ගැලැක්ටෝස් + ග්ලූකෝස්
4. ගැලැක්ටෝස් + ෆෘක්ටෝස්

09. පහත වංශ අතුරින් පෘෂ්ඨවංශීන්ට පරිණාමික බන්ධුතා පෙන්වන සත්ත්ව වංශය වන්නේ පහත කවරක්ද?
(1) ආත්‍රොපෝඩා (2) එකයිනොඩර්මේටා (3) නිඩාරියා (4) ඇනෙලිඩා

10. $CH_3COOH$ සංයෝගයේ මවුලයක අඩංගු 'H' පරමාණු මවුල ගණන කොපමණ ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4

11. මෙම රූපයේ පෙන්වා ඇති ඌනතා ලක්ෂණ ඇති වීමට හේතුවන විටමින් වර්ගය කුමක්ද?



(1) විටමින් - D (2) විටමින් - C
(3) විටමින් - A (4) විටමින් - B

12. $S^{2-}$ අයනයේ ඇති ප්‍රෝටෝන ගණන හා ඉලෙක්ට්‍රෝන ගණන පිළිවෙලින්,
(1) 16, 16 වේ. (2) 16, 18 වේ. (3) 16, 14 වේ. (4) 18, 16 වේ.

13. නිශ්චලතාවයෙන් ගමන් අරඹන මෝටර් බයිසිකල්කරුවෙකු තත්පර 5 කදී $15\ m\ s^{-1}$ ප්‍රවේගයක් අත්කර ගනී. එම කාලය තුල ගමන්කල ත්වරණය වනුයේ පහත කුමන පිළිතුරේ ද?
(1) $2\ m\ s^{-2}$ (2) $3\ m\ s^{-2}$ (3) $5\ m\ s^{-2}$ (4) $6\ m\ s^{-2}$

14. පහත සඳහන් රසායනික ප්‍රතික්‍රියා අතරින් තුලිත රසායනික ප්‍රතික්‍රියාව කුමක්ද?
(1) $Mg + O_2 \longrightarrow MgO_2$ (2) $CaCO_3 \longrightarrow CaO + CO_2$
(3) $SO_3 + H_2O \longrightarrow H_2SO_3$ (4) $2Al + 6HCl \longrightarrow 2AlCl_3 + 2H_2$

15. ද්‍රව පීඩන පොම්පයක වර්ගඵලය $2\ cm^2$ වූ කුඩා පිස්ටනය මත $20000\ N\ m^{-2}$ ක පීඩනයක් ඇති කරයි. එවිට එහි $10\ cm^{-2}$ වර්ගඵලයක් සහිත විශාල පිස්ටනය මත තබා ඇති වස්තුවක් වෙත යෙදෙන බලය වනුයේ
(1) 10 N කි. (2) 20 N කි. (3) 50 N කි. (4) 100 N කි.

16. පහත සඳහන් ඔක්සයිඩ අතුරින් ආම්ලිකතාවයෙන් වැඩිම ඔක්සයිඩය කුමක් ද?
(1) $NO_2$ (2) $SO_3$ (3) $P_2O_5$ (4) $SO_2$

17. උත්ප්‍රේරක කර්මාන්ත වලදී භාවිතයේ වාසියක් වන්නේ,
(1) ලැබෙන ඵල ප්‍රමානය වැඩි කරගත හැකි වීම යි. (2) ඵල ලැබීමට ගතවන කාලය වැඩිකර ගත හැකිවීම යි.
(3) ප්‍රතික්‍රියාව සිදුවන සීඝ්‍රතාව වැඩිවීම යි. (4) ප්‍රතික්‍රියාව සඳහා සහභාගි නොවීම යි.

18. නිව්ටන්ගේ තෙවන නියමය ඇසුරින් පැහැදිලි කළ හැකි වන්නේ පහත සඳහන් කුමන සිද්ධිය ද?
1. කැරම් ඉත්තෙකුට පහරක් වැදීමෙන් සිදුවන චලිතය
2. ධාවනය වන මෝටර් රථයක තිරිංග යෙදූවිට එහි සිටින අය ඉදිරියට විසිවීම.
3. මේසයක් මත තබා ඇති ට්‍රොලියකට බලයක් යොදා ඉදිරියට චලනය වීම.
4. බැලූනයක් පුම්බා අත්හළ විට ඉදිරියට ගමන් කිරීම.

19. පහත සඳහන් සංයෝග අතුරින් මවුලයක ස්කන්ධය සමානව පවතින සංයෝග යුගලය වන්නේ කුමක් ද?
(Na = 23, Mg = 24, O = 16, N = 14, H = 1, S = 32, C = 12)
(1) NaOH, MgO (2) $CO_2$, $H_2S$ (3) $NH_3$, $H_2O$ (4) CaO, MgO


20. කාමර උෂ්ණත්වයේ දී ජලය ද්‍රවයක් ලෙස පවතී. මීට බලපාන ප්‍රධාන සාධකය කුමක් ද?
(1) ජලය අකාබනික සංයෝගයක් වීම. (2) ජලයේ අයනික බන්ධන පැවතීම.
(3) ජලය නිර්ධ්‍රැවීය ද්‍රාවකයක් වීම. (4) ජලයේ ප්‍රබල අන්තර් අණුක ආකර්ශන බල පැවතීම.

21. මානව ප්‍රජනන ක්‍රියාවලියේදී වැදගත් නොවන හෝමෝනය කුමක්ද?
(1) ඉන්සියුලින් (2) ප්‍රොජෙස්ටෙරෝන් (3) ඊස්ටජන් (4) ටෙස්ටොස්ටෙරෝන්


22. පහත දී ඇති රෝග අතුරින් වෛරස් රෝගයක් නොවන්නේ කුමක් ද?
(1) ඩෙංගු (2) ඉන්ෆ්ලුවෙන්සා (3) පිටගැස්ම (4) ඒඩ්ස්

23. කිසියම් මූලද්‍රව්‍යයක සමස්ථානික වල පොදු ලක්ෂණයක් නොවන්නේ,
(1) පරමාණුක ක්‍රමාංකය යි. (2) ඉලෙක්ට්‍රෝන වින්‍යාසය යි.
(3) ප්‍රෝටෝන සංඛ්‍යාව යි. (4) නියුට්‍රෝන සංඛ්‍යාව යි.

24. වෛරස වල ලක්ෂණයක් වන්නේ පහත කුමක්ද?
(1) ඒක සෛලික වේ. (2) බහු සෛලික වේ.
(3) සෛලමය ව්‍යුහයක් නැත (4) ශුන්‍යෂ්ටික සෛලයකි.

25. 

දිග 10 cm හා පළල 5 cm වූ 500 g ක සැන්විච් පාන් ගෙඩියක් මේසයක් මත තබා ඇති ආකාරය රූපයේ දැක් වේ. මෙම පාන් ගෙඩිය නිසා මේසය මත ඇතිවන පීඩනය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) $100\ N\ m^{-2}$ (2) $200\ N\ m^{-2}$ (3) $1000\ N\ m^{-2}$ (4) $1500\ N\ m^{-2}$

26. 


රූපයේ දැක්වෙන්නේ 350 g ක ස්කන්ධයක් සහිත විදුලි පහනක් වහලයේ එල්වා තිබෙන ආකාරය යි. මෙහි වයරය මත යෙදෙන ආතතිය විය හැක්කේ,
(1) 3.5 N කි. (2) 35 N කි. (3) 350 N කි. (4) 3500 N කි.

27. පහත සඳහන් අවස්ථා අතුරින් බල යුග්මයක් ක්‍රියා කෙරන පිළිතුර තෝරන්න?
1. බයිසිකල් රෝදයක මුරිච්චි ඇණයක් ගැලවීම. 2. දොර පියනක් විවෘත කිරීම.
3. ඉස්කුරුප්පු නියනකින් ඇණයක් ගැලවීම. 4. විල්බැරෝවකින් යමක් ගෙනයාම.

28. මෙම රූපයෙන් පෙන්වා ඇත්තේ පහත සඳහන් කුමන ඉලෙක්ට්‍රොනික උපාංගයද?
(1) LED එක කි. (2) LDR එක කි.
(3) ප්‍රතිරෝධකය කි. (4) ධාරිත්‍රකය කි.



29. සහසංයුජ සංයෝග පිළිබඳ පහත කුමන ප්‍රකාශය සත්‍යවේද?
(1) ඝණ, ද්‍රව මෙන්ම වායු අවස්ථාවේ ද පවතී.
(2) සියළුම සහසංයුජ සංයෝග ජලයේ අද්‍රාවය වේ.
(3) සහසංයුජ සංයෝගවල ජලීය ද්‍රාවණ කිසිවක් විද්‍යුතය සන්නයනය නොකරයි.
(4) ද්‍රවාංක තාපාංක ඉහල අගයක් ගනී.

30. ඝර්ෂණ බලයෙන් අපට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ පහත කවරක්ද?
(1) පෘෂ්ඨයක් මත ඇවිදයාමට හැකිවීම.
(2) ධාවනය වන මෝටරයක් නැවැත්වීමට.
(3) කොහු ලනුවකින් යමක් හොඳින් ගැට ගැසීමට හැකිවීම.
(4) රෝදයක් කැරකීමට බෙයාරින් යෙදීම.

31. රසායනික ප්‍රතික්‍රියාවක් සිදු වූ බවට සාක්ෂියක් නොවන්නේ,
(1) වායුවක් පිටවීම යි. (2) වර්ණය වෙනස් වීම යි.
(3) භෞතික අවස්ථාව වෙනස්වීම යි. (4) අවක්ෂේපයක් ඇතිවීම යි.

32. භ්‍රෑණය විකසනය වීමේදී එහි අස්ථි සැකිල්ල විකසනය වීම ඇරඹෙන්නේ කුමන කාල වකවානුවකදී ද?
(1) මාස 05 දී (2) මාස 07 දී (3) මාස 08 දී (4) මාස 04 දී

33. කර්මාන්තශාලාවක භාවිතා වන එක්තරා උපකරණයක 1000 W ලෙස සඳහන් ව ඇත. මෙම උපකරණය භාවිතාකර නිෂ්පාදනයක් කිරීමේදී මිනිත්තු 12ක් ගතවුනි නම් ඒ සඳහා වැයවන ශක්තිය කොපමණ ද?

(1) 1200 J  (2) 12000 J  (3) 72000 J  (4) 720000 J

34.



a



b



c

ඉහත a, b, c ජීවීන් අයත්වන වංශ පිළිවෙලින් සඳහන් කර ඇති පිළිතුර තෝරන්න.

(1) ඇනලිඩා, මොලුස්කා, එකයිනොඩර්මේටා  (2) ආත්‍රොපෝඩා, ඇනලිඩා, නිඩාරියා
(3) එකයිනොඩර්මේටා, මොලුස්කා, නිඩාරියා  (4) මොලුස්කා, නිඩාරියා, ආත්‍රොපෝඩා

35. ස්කන්ධය 150 g වූ ක්‍රිකට් පන්දුවකට පහරක් එල්ල කල පසු $100 \text{ m s}^{-1}$ ප්‍රවේගයකින් පන්දුව ඇදී ගියේ නම් එහි ගම්‍යත්වය විය හැක්කේ

1. $15 \text{ kg m s}^{-1}$ ය.  2. $30 \text{ kg m s}^{-1}$ ය.  3. $60 \text{ kg m s}^{-1}$ ය.  4. $90 \text{ kg m s}^{-1}$ ය.

36. හෘදය කුටීර 3කින් සමන්විත වන සත්ත්ව කාණ්ඩයට අයත් සත්වයකු වන්නේ,

(1) වවුලා ය.  (2) පැස්බරා ය.  (3) සලමන්දරා ය.  (4) පෙන්ගුවින් ය.

37. පහත සඳහන් ප්‍රතික්‍රියා සලකන්න.

(A) $Mg + 2HCl \longrightarrow MgCl_2 + H_2$
(B) $2H_2O_2 \longrightarrow 2H_2O_2 + O_2$
(C) $C + O_2 \longrightarrow CO_2$


ඉහත ප්‍රතික්‍රියා වර්ග පිළිවෙලින් නිවැරදිව දැක්වෙන්නේ කුමන පිළිතුරද?

(1) සංයෝජන, වියෝජන, ඒක විස්ථාපන  (2) සංයෝජන, වියෝජන, ද්විත්ව විස්ථාපන
(3) ද්විත්ව විස්ථාපන, වියෝජන, සංයෝජන  (4) ඒක විස්ථාපන, වියෝජන, සංයෝජන

38. මධ්‍ය පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන අෂ්ඨකය අසම්පූර්ණ අනුව තෝරන්න.


(1) $CO_2$  (2) $H_2S$  (3) $BCl_3$  (4) $CH_4$

39. රූපයේ පරිදි සකසන ලද පරිපථ ඇටවුමක පරිපථයේ සමක ප්‍රතිරෝධය වනුයේ පහත කවර පිළිතුරද?




(1) 2 Ω  (2) 4 Ω
(3) 6 Ω  (4) 12 Ω

40. පහත රූපයේ දැක්වෙන්නේ A, B හා C ලෙස නම්කර සකසා ඇති ලී කුට්ටි 3ක් ජලයට දැමූවිට පවතින ආකාරයයි.




ඉහත A, B හා C වස්තු හා උඩුකුරු තෙරපුම සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් කවරක් සත්‍ය වේද?

a. A වස්තුව මත ක්‍රියාකරන හෝ උඩුකුරු තෙරපුම වස්තුවේ බරට සමාන වේ.
b. B වස්තුව මත ක්‍රියාකරන උඩුකුරු තෙරපුම වස්තුවේ බරට සමාන වේ.
c. C වස්තුව මත ක්‍රියාකරන උඩුකුරු තෙරපුම වස්තුවේ බරට සමාන වේ

(1) a හා b සත්‍ය වේ.  (2) b හා c සත්‍ය වේ.  (3) a හා c සත්‍ය වේ.  (4) a පමණක් සත්‍ය වේ.